" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

**ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත**

**பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்**

**OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE**

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / General Telephone 011 - 2093000

| මගේ අංකය / My No. | CSWP/FIN-AP/03/FI/01 | ඔබේ අංකය / Your No. | | දිනය / Date | 2025.03. 25 |
|---|---|---|---|---|---|

## මුල්‍ය චක්‍රලේඛ 06/2025

ආණ්ඩුකාර ලේකම් (බ.ප.)

අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.)

සභා ලේකම් (බ.ප.)

පළාත් කොමිෂන් සභා වල ලේකම්වරු (බ.ප.)

නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු (බ.ප.)

දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් (බ.ප.)

ව්‍යවස්ථාපිත අධිකාරි වල සභාපතිවරු (බ.ප.)

**රාජ්‍ය මුදල් චක්‍ර ලේඛ 01/2024 (1) පළාත් සභාවට අදාල කරගැනීම**

**පළාත් මුල්‍ය රීති 62 වෙනත් අත්හැර දැමීම් සහ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම යටතේ ලබාදෙන ණය අත්තිකාරම් අත්හැර දැමීම**

භාණ්ඩාගාර ලේකම්ගේ අංක : PFD/RED/WO/109/2024 හා 2025.01.24 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක : 01/2024(1) හි පිටපතක් මේ සමඟ අමුණා ඇත.

02. ආණ්ඩුකාර ලේකම්ගේ අංක : GOS/ADM/6/2/19-2025 හා 2025.03.05 හා 2025.03.24 දිනැති ලිපි මඟින් ඉහත සඳහන් චක්‍රලේඛයෙහි විධි විධාන පහත සඳහන් සංශෝධන සහිතව බස්නාහිර පළාතට අදාල කරගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව දැනුම් දී ඇත. එහෙයින් එම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

- මාතෘකාවෙහි සඳහන් මු.රෙ. 113 යන්න පළාත් මුල්‍ය රීති 62 ලෙස සංශෝධනය කිරීමටත්
- අංක 04 (ii) යටතේ "රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්" යන්න වෙනුවට "පළාත් භාණ්ඩාගාරය වෙත" යනුවෙන් සංශෝධනය කිරීමටත්

| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් / Deputy Chief Secretary | පාලන / Administration | පිරිස් හා පුහුණු / Personnel & Training | මුදල / Finance | සැලසුම් / Planning | ඉංජිනේරු / Engineering | ප්‍රධාන අභ්‍යන්තර විගණක / Chief Internal Auditor |
|---|---|---|---|---|---|---|
| | Tel : 0112092606<br>Fax : 0112092609<br>dcsadmin@cs.wpc.gov.lk | Tel : 0112092631<br>Fax : 0112092647<br>dcspt@cs.wpc.gov.lk | Tel : 0112092640<br>Fax : 0112092636<br>dcsfinance@cs.wpc.gov.lk | Tel : 0112092532<br>Fax : 0112092533<br>dsplan@cs.wpc.gov.lk | Tel : 0112092501<br>Fax : 0112092505<br>dcs@eng.wpc.gov.lk | Tel : 0112092628<br>Fax : 0112092625<br>cia@cs.wpc.gov.lk |

- ❖ අංක 04 (iii) යටතේ "මහා භාණ්ඩාගාරයේ" යන්න වෙනුවට "පළාත් භාණ්ඩාගාරයේ" ලෙස සංශෝධනය කිරීමටත්, හා "රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ" යන්න ඉවත් කිරීමටත්,
- ❖ අංක 05 යටතේ"රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව" යන්නට "පළාත් භාණ්ඩාගාරය" යනුවෙන් සංශෝධනය කිරීමටත්


එස්.එල්. ධම්මිකා කේ. විජයසිංහ
ප්‍රධාන ලේකම්,
පළාත් මුදල් අමාත්‍යාංශ ලේකම් හා
පළාත් භාණ්ඩාගාර ලේකම්,
බස්නාහිර පළාත.

දුරකතන : 0112-093416
ෆැක්ස් : 0112-092636
විද්‍යුත් ලිපිනය : accpay@cs.wpc.gov.lk


පිටපත: 01.විගණකාධිපති
02.අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
03.තොරතුරු තාක්ෂණ නිලධාරී.

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு

MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01. இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700

ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823

වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: PFD/RED/WO/109/2024

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2025.01. 24

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක: 01/2024 (I)

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
පළාත් පාලන ආයතන ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය බැංකු, විශ්ව විද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල ප්‍රධානීන් හා රජය සතු සමාගම්වල සභාපතිවරුන්

**1992 මුදල් රෙගුලාසි සංග්‍රහයේ සහ 2020.08.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020හි විධිවිධාන සංශෝධනය කිරීම**

**මු.රෙ. 113 - වෙනත් අත්හැර දැමීම් සහ රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් "බී" ගිණුම යටතේ ලබාදෙන ණය හා අත්තිකාරම් අත්හැර දැමීම**

බොහෝ රජයේ ආයතන විසින්, දැනට ගිණුම් හා පොත්පත්වලින් ඉවත් කිරීම කළ නොහැකිව පැවති, දිගු කාලයක් තිස්සේ අය නොවී පවතින ණය ශේෂ අත්හැරදැමීමට අවශ්‍ය පියවර ගෙන ඇති නමුත් සමහර රජයේ ආයතනවල ව්‍යුහය අනුව, එම කටයුතු අවසන් කර ගැනීම සඳහා තවත් කාලයක් අවශ්‍ය බවට ඉල්ලීම් ඉදිරිපත් වී ඇත.

**02**. එම ඉල්ලීම් සැලකිල්ලට ගෙන, 2024.05.29 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2024 හි 04 හා 05 හි විධිවිධාන සංශෝධනය කිරීමට මහා භාණ්ඩාගාරය තීරණය කර ඇති අතර එම සංශෝධිත විධිවිධාන පහත සඳහන් පරිදි වේ.

**"04. අන්තර්කාලීන විධිවිධාන**

04. (i) දැනට ගිණුම් හා පොත්පත්වලින් ඉවත් කිරීම කළ නොහැකිව පැවති, දිගු කාලයක් තිස්සේ අය නොවී පවතින ණය ශේෂ අත්හැරදැමීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා පහත සඳහන් විශේෂිත සීමාවන් යටතේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරින් වෙත බලය පවරනු ලැබේ. මෙම ණය ශේෂයන් නිරවුල් කිරීමට/ කපාහැරීමට/ අත්හැරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්/ ගණන්දීමේ නිලධාරීන් පෞද්ගලිකව අවධානය යොමු කළ යුතු අතර ඒ සඳහා වන නියෝගයන් ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/ අදාළ අතිරේක ලේකම්වරු/ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරු හෝ වෙනත් අදාළ නිලධාරීන් වෙත ලිඛිතව ලබාදිය යුතු ය.

අදාළ සිදුවීම හෝ ණය අයකර ගැනීම පාතර වී,

| | |
|---|---|
| (i) අවුරුදු 5ට වඩා අඩු කාලයක් ගත වී ඇති ණය ශේෂ | එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් ණය ශේෂය 25,000/-ක් නොඉක්මවන විටෙකදී |
| (ii) අවුරුදු 05-10 අතර කාලයක් ගත වී ඇති ණය ශේෂ | එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් ණය ශේෂය 50,000/-ක් නොඉක්මවන විටෙකදී |
| (iii)අවුරුදු 10-20 අතර කාලයක් ගත වී ඇති ණය ශේෂ | එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් ණය ශේෂය 75,000/-ක් නොඉක්මවන විටෙකදී |
| (iv) අවුරුදු 20ට වඩා වැඩි කාලයක් ගත වී ඇති ණය ශේෂ | එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් ණය ශේෂය 100,000/-ක් නොඉක්මවන විටෙකදී |

04. (ii) තව ද, ඉහත 04 (i) හි සීමාවන් යටතේ කටයුතු කළ නොහැකි ණය ශේෂයක් පවතී නම්, එයට හේතු හා ගතහැකි ඉදිරි පියවර නිශ්චිතව සඳහන් කරමින් ඒ පිළිබඳව රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත **2025.03.31** දිනට පෙර දන්වා එවිය යුතු ය.

04. (iii) ඉහත 04 (i) හි අන්තර්කාලීන විධිවිධාන යටතේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් වෙත පවරනු ලැබ ඇති බලය **2025.03.31** දක්වා පමණක් වලංගු වන අතර අය වෙමින් පවතින ණය ශේෂ හා **2025.03.31** දින වන විට නීතිමය වශයෙන් කටයුතු කිරීමට/නඩු පැවරීමට ක්‍රියාමාර්ග ගනු ලබන හෝ නඩු පවරා ඇති හෝ ණය ශේෂයන් හැර රජයේ අත්තිකාරම් "බී" ගිණුමේ වර්ෂ 5කට වැඩි කාලයක් නිරවුල් නොවී පවතින කිසිදු ශේෂයක් **2025.03.31** දිනෙන් ඔබ්බට ගෙනයාමෙන් වැළකීමට අවශ්‍ය සියළු පියවර ගැනීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්/ ගණන්දීමේ නිලධාරීන් වග බලා ගත යුතු ය. කෙසේ වුව ද, මේ සම්බන්ධයෙන් යම් ගැටළුවක් පවතී නම් මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමග සාකච්ඡා කර ලබාගන්නා උපදෙස් අනුව අදාළ ගැටළුව නිරාකරණය කර ගැනීමට කටයුතු කළ යුතු ය.

**05.** තව ද, එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් අත්හැර දමන ණය ශේෂ පිළිබඳ විස්තර **2025.04.15** දිනට පෙර රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කිරීමට කටයුතු කළ යුතු ය."

**03.** 2024.05.29 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2024 හි සඳහන් අනෙකුත් විධිවිධාන එපරිදිම බලපැවැත්වේ.

කේ. එම්. මහින්ද සිරිවර්ධන
භාණ්ඩාගාරයේ ලේකම්

පිටපත්: 01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. අමාත්‍ය මණ්ඩල ලේකම්
04. විගණකාධිපති